මාධ්‍ය නිවේදන අංක - 16

# මැතිවරණ කොමිෂන් සභාව

## මාධ්‍ය නිවේදනය

2021.06.08 දින රැස්වූ මැතිවරණ කො◌ාමිෂන් සභාව විසින් මතු දැක්වෙන තීරණ ගෙන ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

1. **පළමුවන ශ්‍රේණියට ළමුන් ඇතුළත් කිරිමේ ඉල්ලුම්පත්‍ර සම්පූර්ණ කිරිම සඳහා ඡන්ද හිමි නාමලේඛන තොරතුරු**

2022 වර්ෂයේ රජයේ පාසල්වල පළමුවන ශ්‍රේණියට ළමයින් ඇතුළත් කිරිමේ අයදුම්පත්‍රය සම්පූර්ණ කිරීමට අවශ්‍ය වන 2016, 2017, 2018, 2019 සහ 2020 වර්ෂවල ඡන්ද හිමි නාමලේඛන තොරතුරු පහත සඳහන් අයුරින් ලබාදීම.

- ඡන්ද හිමියෙකු වශයෙන් ලියාපදිංචි වී සිටින ග්‍රාම නිලධාරි වසමේ ග්‍රාම නිලධාරි හමුවී අවශ්‍ය වර්ෂවල තොරතුරු ලබා ගැනීම.
- අන්තර්ජාල පහසුකම් භාවිතාවෙන් ***www.elections.gov.lk*** දරන මැතිවරණ කොමිෂන් සභාවේ වෙබ් අඩවියට පිවිස ජාතික හැඳුනුම්පත් අංකය ඇතුළත් කර තොරතුරු ලබා ගැනීම.

ඉහත සඳහන් පරිදි ලබා ගනු ලබන තොරතුරු ග්‍රාම නිලධාරි හෝ වෙනත් නිලධාරියෙකු විසින් සහතික කිරීම අවශ්‍ය නොවන බව අවධාරණය කරනු ලැබේ.

එමෙන්ම, රජයේ පාසල්වල පළමුවන ශ්‍රේණියට ළමුන් ඇතුළත් කිරීමේ, අයදුම් පත්‍ර සම්පූර්ණ කිරිම සඳහා ඡන්ද හිමි නාමලේඛන උපුටන නිකුත් නොකරනු ලබන හෙයින්, ඒ සඳහා හෝ ඒ සම්බන්ධ තොරතුරු ලබා ගැනීම සඳහා දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල වෙත හෝ ප්‍රාදේශිය ලේකම් කාර්යාල වෙත යාම අනවශ්‍ය වේ.

2. **2021 වර්ෂයේ ඡන්ද හිමි නාමලේඛන ප්‍රතිශෝධනය.**

2021 වර්ෂය සඳහා ඡන්ද හිමි නාමලේඛන ප්‍රතිශෝධන කටයුතු ජුනි මස 01 දින ආරම්භ කරන ලදී. රට තුළ පවත්නා කොවිඩ් වසංගත තත්ත්වය පාලනය පිණිස රජය විසින් ගෙන ඇති සෞඛ්‍ය මාර්ගෝපදේශ අනුව සංචරණ සීමා අවම වන පරිදි නව ක්‍රමවේදයකට මෙම කටයුතු සිදුකිරීමට මැතිවරණ කොමිෂන් සභාව තීරණය කර ඇත. ඒ අනුව 2020 වර්ෂයේ ඡන්ද හිමි නාමලේඛනයේ ස්වකීය පදිංචියට අදාළ තොරතුරු පරික්ෂා කොට බලා එකී ලියාපදිංචි ස්ථානය සංශෝධනය කළ යුතු නම් පමණක් එම ප්‍රදේශයේ ග්‍රාම නිලධාරි හමුවී ඊට අදාළ ආකෘති පත්‍ර සම්පූර්ණ කොට ඉදිරිපත් කිරීම ප්‍රමාණවත් වේ.

සමන් ශ්‍රී රත්නායක,
මැතිවරණ කොමසාරිස් ජනරාල්

මැතිවරණ කොමිෂන් සභාව,
රාජගිරිය.
2021.06.08